# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2066/32 – 2018 අප්‍රේල් 11 වැනි බදාදා – 2018.04.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

39 අ (1) වැනි වගන්තිය යටතේ නියමය

2013 පෙබරවාරි මස 07 වැනි දින අංක 1796/18 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* (460 වැනි අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පළ කරන ලද 2013 අංක 41 දරන ආඥාවේ සඳහන් ඉඩම් කොටස් රජය වෙත සම්පූර්ණයෙන්ම සතු වී ඇති අතර, රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටස්වල සන්තකය ද ලබාගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුළත් කරන ලද) 39 අ (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය ගයන්ත කරුණාතිලක වන මම, එකී ඉඩම් කොටස් අතුරින් මෙහි පහත 1 වන උපලේඛනයෙහි සඳහන් ඉඩම් කොටස් පමණක් මෙම නියමය මගින් අවසතු කරමි.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: 4/3/10/2012/LRB/18.
ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාගේ අංකය: WGSWD&EIP/ACQ/KB/07.

2018 අප්‍රේල් මස 06 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
මිහිකත මැදුර, ඉඩම් මහ ලේකම් කාර්යාලය,
අංක 1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

1 වන උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කැස්බෑව, මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල අංක 535/සී, පැපිලියාන - නැගෙනහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, දිවුලපිටිය, පැපිලියාන, ගංගොඩවිල ගම්වල පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙළ කරන ලද අංක කො 9467 හා 2015.11.18 දිනැති මූලික පිඹුරේ පෙන්නුම් කර ඇති පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුක්ත වූ ඉඩම් කොටස්වලට මායිම්:

**01. කැබලි අංක 4 – සුනේත්‍රා දේවී පාරේ වරිපනම් අංක සොයාගත නොහැකි ඉඩමේ කොටසක් – ප්‍රමාණය: හෙක්. 0.0085**

උතුරට: කැබලි අංක 3; නැගෙනහිරට: කැබලි අංක 3 සහ 5; දකුණට: කැබලි අංක 5 සහ සුනේත්‍රාදේවී පාරේ වරිපනම් අංක සොයාගත නොහැකි ඉඩම; බටහිරට: සුනේත්‍රාදේවී පාරේ වරිපනම් අංක සොයාගත නොහැකි ඉඩම් සහ කැබලි අංක 3.

**02. කැබලි අංක 5 – සුනේත්‍රා දේවී පාරේ වරිපනම් අංක සොයාගත නොහැකි ඉඩමේ කොටසක් – ප්‍රමාණය: හෙක්. 0.0040**

උතුරට: කැබලි අංක 4 සහ 3; නැගෙනහිරට: කැබලි අංක 3 සහ 7; දකුණට: කැබලි අංක 7, මාර්ගය සහ සුනේත්‍රාදේවී පාරේ වරිපනම් අංක සොයාගත නොහැකි ඉඩම; බටහිරට: සුනේත්‍රාදේවී පාරේ වරිපනම් අංක සොයාගත නොහැකි ඉඩම් සහ කැබලි අංක 4.

04-936

1A – G027465 – 57 (2018/04)
මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය) ශුද්ධි පත්‍රිකාව

### 39අ (1) වැනි වගන්තිය යටතේ නියමය

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 39 අ (1) වැනි වගන්තිය යටතේ නියමය ඇතුළත් අංක : 2051/39 හා 2017.12.29 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 39 අ (1) වැනි වගන්තිය යටතේ නියමයෙහි සඳහන්

" 2014 දෙසැම්බර් මස 09 වැනි දින අංක 1868/50 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* (460 වැනි අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පළ කරන ලද 2014 අංක 139 දරන ආඥාවේ ඇතුළත් අංක එම්ආර්/ඩබ්ලිව්එල්ජී/2014/215 හා 2014.10.29 දිනැති ප්‍රගමන අනුරේඛනයේ කැබලි අක්ෂර "පී" ලෙස සඳහන් ඉඩම් කොටස් සම්පූර්ණයෙන්ම රජය සතු වී ඇති අතර, රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටස්වල සන්තකයද ලබා ගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුළත් කරන ලද) 39 අ (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය ගයන්ත කරුණාතිලක වන මම එකී ඉඩම් කොටස් අතුරින් පහත උපලේඛනයේ සඳහන් ඉඩම් කොටස් පමණක් මෙම නියමය මගින් අවසතු කරමි." යන්න,

"2014 ජුනි මස 25 වැනි දින අංක 1868/50 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* (460 වැනි අධිකාරය වූ) පලකර 2014 දෙසැම්බර් මස 09 වැනි දින අංක 1892/23 දරන ශ්‍රී ලංකා ප්‍රජාත්‍රාන්තික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* පල කර ශුද්ධි පත්‍රිකාවක් මගින් සංශෝධනය කරන ලද 2014 අංක 139 දරන ආඥාවේ ඇතුළත් අංක එම්ආර්/ඩබ්ලිව්එල්ජී/2014/215 හා 2014.10.29 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සඳහන් ඉඩම් කොටස් සම්පූර්ණයෙන්ම රජය සතු වී ඇති අතර, රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටස්වල සන්තකයද ලබා ගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුළත් කරන ලද) 39 අ (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය ගයන්ත කරුණාතිලක වන මම එකී ඉඩම් කොටස් අතුරින් පහත උපලේඛනයේ සඳහන් ඉඩම් කොටස් පමණක් මෙම නියමය මගින් අවසතු කරමි."

ලෙස සංශෝධනය විය යුතු බව මෙයින් ප්‍රකාශ කරමි.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: 4-3/6/2014/HW/93.
2018 අප්‍රේල් මස 06 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
මිහිකත මැදුර,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

04-937

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.